## ඇමෙරිකානු තානාපති අතුල් කෙශාප් ගේ ප්‍රකාශය

## USS බ්ලුරිජ් නෞකාව පිළිගැනීමේ උත්සවය
## 2016 මාර්තු 28

අද්මිරාල් ඔකොයින් ඔබගේ අදහස් දැක්වීමට බොහොම ස්තුතියි. ඒ වාගේම මෙම නෞකාව සහ එහි කාර්යය මණ්ඩලය මෙහි රැගෙන ඒම පිළිබඳවත් මා අතිශයින් ස්තුතිවන්ත වෙනවා. ඔබ සියලු දෙනා මෙහි පැමිණීම සම්බන්ධයෙන් මා ඉතා ප්‍රීතියට පත්වෙනවා. මම ඉතා කෙටියෙන් අදහස් පළකරනවා.

දකුණු ආසියාවේ ජනතාව  වැසි වැටීම වාසනාවන්ත  ලක්ෂණයක් ලෙස සලකන බව ප්‍රථමයෙන්ම පැවසිය යුතුයි. අද රාත්‍රියේ අප සියලු දෙනා එය වාසනාවන්ත ලකුණක් ලෙස සිතනවා. මෙහිදි මම ඉතා කෙටියෙන් සාරාංශගතව අදහස් දක්වනවා. ඒ  ජීවිතයට ජීවය ගෙනදෙන ප්‍රබෝධවත් කරන වර්ෂාවක් පැමිණෙන බවක් දැනෙන නිසා.

පළමුවෙන්  මම අද්මිරාල් ඔකොයින්ව සාදරයෙන් පිළිගන්නවා. එසේම කපිතාන් හිගින්ස් සහ USS බ්ලූ රිජ් හි කාර්යය මණ්ඩලය සාදරයෙන් පිළිගන්නවා.

බ්ලු රිජ් යනු වර්ජිනියාවේ මාගේ ගම් ප්‍රදේශය වන චාල්ස්විල් ප්‍රදේශයේ පිහිටා තිබෙන කඳු වළල්ලක නාමයයි. මාගේ නිවස ගැන ටොන් 20,000 ක  මතකයක් ඉන්දියානු සාගරයට ගෙන ඒම පිළිබඳව ඔබට ස්තුතියි!

බ්ලූ රිජ් හි නාවිකයින් සම්බන්ධයෙන් වචනයක් දෙකක් පැවැසීමට මට අවශ්‍යයි. මෙහි සේවය කරන පිරිමින් සහ කාන්තාවන් එක්සත් ජනපදයේ සියලුම ප්‍රදේශයන්ගෙන් පැමිණි අයයි. ඔවුන්ගෙන් බොහෝදෙනෙක් වයස අවුරුදු 18,19, 20 වයසේ පසුවන අයයි. ඔවුන්ගේ දෙමාපියන් සහ  මුතුන් මිත්තන් ලෝකයේ විවිධ ප්‍රදේශයන් නියෝජනය කරනවා.  ඔවුන් අද නෞකාවේ කාර්යය මණ්ඩලය ලෙස එක්සත්ව සිටිනවා. එසේ සිටින්නේ  ඔවුන් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා ස්වාධීනත්වය යන ඇමෙරිකානු සාරධර්ම සුරැකීමට කැපවී සිටින නිසායි. මෙම නිසා ඇත්ත වශයෙන්ම අපිට ඔවුන් මෙහිදී හමුවීම සහ මෙම වරායේ රැඳී සිටින විට ඔවුන් සමග සම්බන්ධතා පැවැත්වීමට අවස්ථාව ලැබීම අතිශයින්ම සතුට දනවන කරුණක්.

මෙම සංචාරය එක්සත් ජනපදයට අයත් නෞකාවක් වසර පහකට පසුව සිදු කරන ප්‍රථම සංචාරයයි. ඔවුන් මෙහි පැමිණීම සම්බන්ධයෙන් අපි මහත් ප්‍රමෝදයට පත්වී සිටින අතර මෙවැනි සංචාරයන් ගණනාවක ආරම්භය සනිටුහන් කරන පළමු සංචාරය යැයි සිතනවා, එසේම අපි මෙම අවස්ථාවට ගරු කථානායක තුමා, ගරු විදේශ කටයුතු අමාත්‍ය තුමා සහ අද්මිරාල් මෙන්ම තානාපති කාරියවසම් සහභාගී වී සිටීම මහත් ගෞරවයක් ලෙස සලකනවා.

නෝනාවරුනි මහත්වරුනි, මෙම නෞකාව අද මෙහි පැමිණ තිබෙන්නේ ශ්‍රී ලාංකීය ඡන්දදායකයින් පසුගිය වසරේ ජනවාරි 8 සහ අගෝස්තු 17 පැවැති මැතිවරණයන් දෙකෙහිදී ඡන්දය ලබාදීමේදී සැලකිල්ලට ගත් සාරධර්මයන් වලට ඇමෙරිකානු ජනතාවගේ ගරුකිරීම සහ අගය කිරීමක් වශයෙන්ය.

ශ්‍රී ලංකාව සංහිඳියාවෙන් යුතු සාමකාමී, එක්සත් සෞභාග්‍යමත් සහ නිදහස් රටක් බවට පත්කිරීම සඳහාවූ ශ්‍රී ලාංකිකයින්ගේ දැක්ම අපි අගය කොට සලකන අතර නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය සමස්ථ ඉන්දියානු පැසිෆික් කළාපයටම ස්ථාවරභාවයේ කුලුණක් සහ සෞභාග්‍යය ගෙන දෙන්නක් ලෙසට සැලකිය හැකියි. ශ්‍රී ලංකාවේ ජනතාවගේ සහ ඇමෙරිකානු ජනතාවගේ අභිලාශයන් එකිනෙකට සමාන වීම අපි ඉතා අගය කොට සලකනවා.

එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් වරයෙක් වසර 41 කට පසුව සිදුකරන ලද පළමු ශ්‍රී ලංකා සංචාරයේදී එනම් ජෝන් කෙරී පසුගිය මැයි මාසයේදී මෙහි පැමිණි අවස්ථාවේදී "අපි ශ්‍රී ලංකාවේ ජනතාවගේ සහ ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින්ගේ දැක්මට පූර්ණ සහාය දක්වනවා" යැයි පැවසුවා. මෙම නෞකා සංචාරය මගින්, මිලෙනියම් චැලෙන්ජ් කෝපරේෂන් මගින් සහ ඇමෙරිකාවේ ඉහළ පෙළේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සංචාරයන්ගෙන් සහ ඔබ සියලු දෙනා මෙහි පැමිණ සිටීම මගින් අපගේ සහාය දැක්වීම තහවුරුවෙනවා .

ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර මිත්‍රත්වය අපගේ දෙරටේ සහ සමස්ථ ලෝකයේ යහපත වෙනුවෙන් දිගුකාලීන පවතීවා යැයි මම ප්‍රාර්ථනා කරනවා.

ඔබ සියලුම දෙනාට බොහොම ස්තුතියි